# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.12 පැය 1500 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1748/25 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## දඹදෙණිය ඓතිහාසික ශ්‍රී දළදා පෙරහර හේතුවෙන් රථවාහන ගමනා ගමනය සීමා කිරීම - ගිරිඋල්ල පොලිස් වසම.

ගිරිඋල්ල පොලිස් වසමේ ඓතිහාසික දඹදෙණිය විහාරස්ථානය විසින් වාර්ෂිකව පවත්වනු ලබන දළදා පෙරහර 2025.09.13 වන දින වීථි සංචාරය කිරීමට නියමිතය.

මෙම පෙරහර අලි ඇතුන් ඇතුළු නර්තන ශිල්පීන්ගෙන් සමන්විත අංග 75 කට ආසන්න ප්‍රමාණයක් පෙළගස්වා ඇති අතර පෙරහර නැරඹීම සඳහා විශාල බැතිමතුන් පිරිසකගේ පැමිණීම අපේක්ෂා කරනු ලබයි.

එබැවින් මෙම පෙරහර 2025.09.13 වන දින රාත්‍රී 08.00 සිට 2025.09.14 වන දින අළුයම 02.00 දක්වා වීථි සංචාරය කරන කාලය තුළ ගිරිඋල්ල පොලිස් වසම හරහා ඇති කොළඹ කුරුණෑගල ප්‍රධාන මාර්ගය හා කුරුණෑගල මීගමුව මාර්ගයේ දැඩි රථ වාහන තදබදයක් ඇති විය හැකි බැවින් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය රථ වාහන රියදුරන්ගෙන් හා මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

### විකල්ප මාර්ග

- ගිරිඋල්ල - නාරම්මල ප්‍රධාන මාර්ගයේ නාරම්මල දෙස සිට පැමිණෙන සියළුම බරවාහන දම්පැලැස්ස හන්දියෙන් ඇතුල් කර අලව්ව මාර්ගයට පිවිසිය හැක.

- ගිරිඋල්ල නාරම්මල ප්‍රධාන මාර්ගයේ නාරම්මල දෙස සිට පැමිණෙන සැහැල්ලු වාහන මුතුගල හන්දියෙන් ඇතුල් කර අලව්ව මාර්ගයට ගමන් කල හැකිය.

- මීගමුව නාරම්මල මාර්ගයේ නාරම්මල දෙසට ධාවනය කරන සියලු බර වාහන හා සැහැල්ලු වාහන මාහරගම හන්දිය හරහා අලව්ව ප්‍රධාන මාර්ගයට පිවිසිය හැකිය.

- මුතුගල ගිරිඋල්ල අතර දිවෙන වාහන මුතුගල හන්දිය හරහා කුඩගම්මන ප්‍රදේශයෙන් අලව්ව මාර්ගයට ඇතුළු විය හැකිය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**